## උපන්දින සුබ පැතුම්!



පසු ගිය මස දෙවන වසරට පා තැබූ දිල්හාන් යාපා අබේවර්ධන ආදරණීය පුතුට බුදු සරණ හා සියළු දෙවි රැකවරණින් සුබ අනාගතයකට ආසිරි පතන්නේ ආදර අම්මා, තාත්තා, නැනා, ආශා නැන්දා, පාලින්ද මාමා සහ ට්‍රෝයි අයියා.

## උපන්දින සුබ පැතුම්!



මෙම දෙසැම්බර් මස 14 වෙනි දින පළමු වසරට පා තබන ආදරණීය අකිල් පුතාට ඉතා සුබ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා, තාත්තා, මලීහා අක්කා, සීයා, ආච්චී ඇතුළු සියළු දෙනා.

*- තලවතුගොඩ - කෝට්ටේ.*

# උතුරේ සටනේ නියුතු රණවිරුවන්ගේ පාද ආරක්ෂාකරන බෙහෙත් ආලේප වහා අවශ්‍යයි

උතුරේ සටන් බිමේ යුදවැදී සිටින අපේ හමුදා සේනාංකයන්හි වීරෝදාර රණවිරුවන් විසින් කොතරම් කැපවීමකින් අව්වැසි නොබලා, ගොඩබිම, මුහුද, කලපුව නොබලා, දිවි නොතකා කරනු ලබන මහත් අරගලය කොපමණදැයි වචනයෙන් විස්තර කළ නොහැකිය. ඔවුන් විඳින කටුක ජීවිතය තවත් උග්‍රවන්නේ මඩගොහොරු ආදියේ දින ගණන් පාවහන් පැළඳගෙන සිටිමින් සතුරාට මුහුණ දෙමින් ඔවුන් අභිබවා යද්දී තම සපත්තු ඇතුළේ දෙපා වල හම තුවාලව ගැලවී යද්දීත් ඒ කිසිවක් නොතකා දිගටම සටනට බැස සිටින නිසාය. අඩුම තරමේ ඔවුන්ගේ දෙපා සුවකරන බෙහෙත් ආලේප කිසිවක් ඔවුන් වෙත ලබාදීම අපේ යුතුකමය.

එබැවින් එක්සත් රාජධානියේත් මේ පුවත්පත කියවන අනෙක් රටවලත් වෙසෙන දේශහිතෛෂීන්ගෙන් අප ඉල්ලා සිටින්නේ පාදයන්හි ඇඟිලි පැසවීමෙන් ආරක්ෂාකරන බෙහෙත්, ස්ප්‍රේ හෝ වෙනත් ඒ සමාන ආලේප බෙහෙත් හල්වලින් ගෙන ශ්‍රීලංකා තානාපති කාර්යාලවලට වහා බාරදෙන ලෙසය. මේ දුටු වහාම ක්‍රියාත්මක වන්න. හරි බෙහෙත කුමක්දැයි ඔබ නොදනී නම් අවශ්‍යතාව කුමක්දැයි බෙහෙත් හලේ, පාමසියේ අයට විස්තර කර සුදුසු බෙහෙතක් මිළදී ගන්න. ශ්‍රීලංකා තානාපති කාර්යාල වලින් නොපමාව ඒ බෙහෙත් උතුරේ ක්‍රියාන්විතයේ නියැළි රණවිරුවන්ට යවනවා ඇත. මෙය ශ්‍රීලංකා ආරක්ෂක අමාත්‍යාංශය විදේශයන්හි වෙසෙන ශ්‍රීලංකා ජනතාවට කළ ආයාචනයකි.



## උතුරේ රණවිරු කැපවීම

විදේශයන්හි සිටින අයත්, කොළඹ සුවපහසු ජීවිත ගතකරන අයත් වැඩි දෙනා දන්නේ උතුරේ යුද්ධයක් තිබෙන බව පමණි. ඔව්හු අපේ සේනාංකයන්හි කැපවීම කොතරම්දැයි නොදනිති. මේ ඡායාරූපය ඒ කැපවීම විදහා පායි. මෙවැනි පින්තූර දහස් ගණනක් ඇත.

## ලකී වීරසේකර මහතා

## Mr Luckshman Weerasekera (Lucky)




Husband of Chandra, father of Thushan and Shantha, father-in- low of Ushma, grandfather of Elina and Kiera, passed away in London.

The funeral took place at London's Golders Green Crematorium on 06 December 2008.

**May He Attain Nibbana !**

## ♥ පැටියො ඩාලිං



පැටියො ඉන්දියාව පකිස්ථානෙට දොස් කිව්වලු අර මුම්බායි ත්‍රස්තවාදින්ට උදව් කළයි කියලා. පකිස්ථානෙ කිව්වලු " අපි කාටවත් එහෙම උදව් කරලා නැහැ, හැබැයි උඹලා නේද ලංකාවෙ ත්‍රස්තවාදෙට දැනුත් උදව්කරන්නෙ? " කියලා. අන්න ඉන්දියාව දැන් කසාය බීපු ගොළුව වගේ ඉන්නවා.

## Sinhala Lesson 128 සිංහළ පාඩම

### සිංහල ඉගෙනීමට පහසු මගක් !

### The Conditional Verb - If අසම්භාව්‍ය ක්‍රියාව

**A. මෙම වාක්‍ය ඉංග්‍රීසියට හරවන්න**

1 මාමා ආවොත් අපට චොකලට් ගෙනේවි
2 ඇඳ යට බැලුවා නම් සපත්තු සොයාගත හැකිවෙයි
3 අප දිනපතාම ඇවිදින්නේ නම් ශරීර සනීපයට හොඳයි.
4 ගොයම් වැව්වොත් අස්වැන්න ලැබෙන්නේය
5 2004 දී ලංකාවට ගියේ නම් සුනාමිය දකින්නට තිබුණි.
6 බඩගිනි නම් ඉක්මනින් කෑම කමු.

**B. මෙම වාක්‍ය සිංහලටහරවන්න**

1. If the sun shines we will play in the park
2. Everyone will clap if you dance beautifully
3. If you want a lift to the station ask father
4. If you are not hungry eat later
5. If Akka has the time she might visit us.
6. If I get that money I will buy a bicycle.

**C. Find the meanings of these words and try to use them in sentences.**

ඉව්වොත්, කැපුවොත්, වුනොත්, ගියොත්, වැසුවොත්, ගැහුවොත්

**D. Try to turn into conditional verbs that you already know and use them in sentences.**

♦ ආචාර්‍ය සුභද්‍රා සිරිවර්ධන
Dr Subhadra Siriwardane - MA PhD London

## හරස්පද ප්‍රහේලිකා 105

**හරහට :**
1 උතුරේ රට රකින පිරිස
5 මැණික්වලට ප්‍රසිද්ධ ය.
7 බත් කෑමට ලැදි තැනැත්තා
8 දේශය
9 රත්තරන් වලට නමකි.
10 රඹුටන්වලට ප්‍රසිද්ධ ගම.

| | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | ■ |
| 5 | | | | 6 |
| 7 | | ■ | 8 | |
| | ■ | 9 | | |
| ■ | 10 | | | |

**පහළට :**
1 උගතුන්ගේ කියුම් මෙවැනිය
2 සීයා මෙසේද හැඳින්වේ.
3 භික්ෂූන්ට පිළිගැන්වේ.
4 ගොවියන් කුඹුරේ දී කරන දෙයකි.
6 ලංකාවේ වැඩිපුර ඉන්නේ මෙවැනි දේශපාලකයන්ය.
9 මෙය නොදැනීම ගෙවී යයි.

***ගියවර නිවැරදි විසඳුම්***

**හරහට :** 1 හාමු 3 සම 5 රත්නපුර 7 සිතාර 8 පවන 10 යහතින්
**පහළට :** 1 හාරසියය 2 මුත්තා 3 සපු 4 මරදාන 6 නරපති 9 වන්

## නේක රසෙන් පිරිපුන් සිංහල ඉවුම් පිහුම්

### බැදගත් මාලු ව්‍යංජනය
### Fried Fish Curry

***අවශ්‍ය ද්‍රව්‍ය :***
තෝර මාළු රා ½ ක්
මිරිස් කුඩු තේ හැඳි 2 ක්
දෙහි ගෙඩියක යුෂ
සිහින්ව ලියාගත් අමුමිරිස් කරල් 2 ක්
ගම්මිරිස් කුඩු තේ හැඳි 1 ක්
සිහින්ව ලියාගත් රතුළූණු රා ½ ක්
සුදු ළූණු බික් 2 ක්
කහ සහ ලුණු ප්‍රමාණවත්ව
ඉඟුරු කැබැල්ලක්
විනාකිරි මේස හැඳි 1 ක්
සේරා සහ කරපිංචා අවශ්‍ය පමණ

***සාදන ක්‍රමය :*** මාළු සෝදා තරමක කැබලි වලට කපාගන්න. ඉන්පසු එවායේ දෙහි ඇඹුල් තවරා ඒ මතු පිට ගම්මිරිස්, ලුණු සහ කහ ද ඝණකමට තවරන්න. පැයක් පමණ පදම් වෙන්නට පසෙක තබන්න. ඉන්පසු ඒවා ලාවට රන්වන් පැහැවනතුරු තාච්චියක බැදගන්න.

ඉතිරි කළමනා සියල්ල විනාකිරිවල අඹරාගන්න. වතුර ප්‍රමාණයක් ඊට දමා ලිප තබා තම්බන්න. එය ක්‍රමයෙන් උකු ස්වභාවයට පැමිණෙන විට කලින් බැදගත් මාළු කැබලි එහි බහා තව ටික වෙලාවක් පිසගන්න. ඉස්ම මඳක් හිඳී උඩ යාන්තමට තෙල් තට්ටුවක් එනවිට ලිප නිවන්න.

♦ *හරිනි ද සිල්වා* Galle, Sri Lanka

( මෙහි පළකිරීම සඳහා ඔබ දන්නා රසවත් සිංහළ කෑම වට්ටෝරු ලියා එවන්න.)

Sam's
CHICKEN
CHICKEN
CHICKEN
Great Tasting! Great Value!
සැම්ස් චිකන්
17 HIGH STREET, WEALDSTONE, HARROW HA3 5BY, TEL: 020 8861 1872
439 HIGH ROAD, WILESDEN, LONDON NW10 2JJ, TEL: 020 8451 7662
84 HIGH STREET, HARLESDEN, LONDON NW10 42J, TEL: 020 8838 2036
246 KINGSBURY ROAD, KINGSBURY, LONDON NW9 9HN, TEL: 020 8204 1432